චක්‍රලේඛ අංක : 1993/07

මගේ අංකය : 2/ ක්‍රීවිබා/ 1/ 9
ක්‍රීඩා/විෂය බාහිර කටයුතු ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල,
1993 මැයි මස 14 දින.

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

## ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ රාජකාරී කාලසීමාවන් හා විෂයය ඉගැන්වීම.

පුහුණු, විද්‍යාපීඨ ඩිප්ලෝමා, නුපුහුණු, අභ්‍යාසලාභී යන කුමන පදනමක් යටතේ හෝ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ගුරු පත්වීමක් ලබා ඇති සෑම ගුරුවරයෙක් ම ශාරීරික අධ්‍යාපන විෂයය පාසල්වල ඉගැන්විය යුතු අතර වෙනත් විෂයයන් ඉගැන්වීම සඳහා නොයෙදවිය යුතුය.

දනටමත් ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ගුරු පත්වීමක් ලබා වෙනත් විෂයයන් උගන්වන ගුරුවරු පාසල්වල සිටිත් නම් ඔවුන් ශාරීරික අධ්‍යාපන විෂයය ඉගැන්වීමට සැලැස්විය යුතුය. එසේ ප්‍රමාණවත් කාලච්ඡේද සංඛ්‍යාවක් ලබාදීමට නොහැකි නම් එම ගුරුවරුන් පුරප්පාඩු ඇති පාසලකට මාරු කිරීම හෝ සතියේ දින කිහිපයක් වෙනත් පාසලකට අනුයුක්ත කිරීම හෝ කළ යුතුය.

සෑම ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙක්ම සතියකට පැය 20 ක් අවම වශයෙන් ශාරීරික අධ්‍යාපන විෂයය ඉගැන්විය යුතු අතර, එම කාලච්ඡේද, විෂයය නිර්දේශයේ ඇතුළත් ක්‍රියාකාරකම් සහ ක්‍රීඩාවන්හි මූලික දක්ෂතා ඉගැන්වීම සඳහාම යොදාගත යුතුය.

විවිධ ක්‍රීඩා පිළිබඳව විද්‍යාලයීය කණ්ඩායම් පුහුණු කිරීම, ශිෂ්‍ය භට බළකාය පුහුණු කිරීම වැනි කටයුතු පාසල් කාල සටහනට ඇතුළත් කාලච්ඡේද තුළ දී නොකළ යුතු අතර ඒ සඳහා පසු කාලය යොදාගත යුතුය.

පසු කාලයේ සිදු කෙරෙන පුහුණුවීම් කටයුතුවල යෙදෙන කාලය අනුමත කාල සටහනට ඇතුළත් කළ හැකිය.

එම්. ඩී. ඩී. පීරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන/ලේකම්.

පිටපත් :

1 කලාපීය අධ්‍යක්ෂවරුන්,

2 කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්

3 ශා. අ. පිළිබඳ නි. අ. අ. / ස. අ. අ. වරුන්
(දැන ගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා)

ඥා/-